(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(17).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 ජනවාරි 10 බදාදා**

**2024 ජනවාරි 23 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

391/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගෙන ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට අයිති ඉඩම්වලින් අඩකට වඩා අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ අත්පත් කර ගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සම්බන්ධයෙන් මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) අනවසර පදිංචිකරුවන් වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා මේ වනවිට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම සැලැස්ම කවරේද;

(vi) අදාළ ආයතන සහ බලධාරීන් විසින් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3549/2023

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර, හොරණ සහ මතුගම යන එක් එක් අධ්‍යාපන කලාපයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව;

(ii) එම එක් එක් අධ්‍යාපන කලාපයේ මේ වනවිට පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(iii) මෑතකදී විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ට ගුරු පත්වීම් ලබා දීමේදී, ඉහත සඳහන් එක් එක් අධ්‍යාපන කලාපයට පත් කරන ලද දෙමළ මාධ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සිසුන් 620ක් පමණ ඉගෙනුම ලබන කළුතර අධ්‍යාපන කලාපයේ ඇති කළු/අල්-හසනියා මහා විද්‍යාලයේ ගණිත ගුරුවරයෙකුගේ පුරප්පාඩුව ඇතුළුව මේ වනවිට ගුරු පුරප්පාඩු 15ක් පමණ පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගුරු පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(iii) ඉහත පාසලේ ප්‍රමාණවත් පරිදි ගොඩනැගිලි පහසුකම් නොමැති බව දන්නේද;

(iv) දානපතියන්ගේ සහයෝගයෙන් ඉදිකරමින් පවතින පන්ති කාමර 12කින් යුත් තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට අවසන් අදියරේ පවතින බව දන්නේද;

(v) එම පන්ති කාමර 12 සඳහා මේස හා පුටු ලබා දීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3596/2023

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන විශේෂ ව්‍යාපෘති ඒකකය විසින් 2022 .07.14 දින සිට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

(ii) එම ඒකකයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, තනතුර, වැටුප් හා දීමනා සහ ලබා දී ඇති වාහන ඇතුලු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඒකකයේ සේවය කරනු ලබන සමස්ථ කාර්යය මණ්ඩලයම දේශපාලන පක්ෂයක පූර්ණකාලීණ සාමාජිකයන් ලෙස කටයුතු කරන බව දන්නේද;

(v) එම ඒකකය නඩත්තු කිරීම සඳහා මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3672/2023

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සේවය කරන ලද අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ තාවකාලික සේවකයන් වර්තමාන රජය බලයට පත් වීමෙන් පසුව සේවයෙන් ඉවත් කර තිබේද;

(ii) එසේ ඉවත් කර ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉවත් කරන ලද එම සේවකයන් නැවත සේවයට කැඳවන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සේවකයන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3707/2023

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2023 ඔක්තෝබර් 01 දින වන විට —

(i) රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන්, ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන පරිපාලන සේවයේ විදුහල්පතිවරුන් සංඛ්‍යාව;

(ii) ගණිතය, විද්‍යාව, තාක්ෂණය, ඉංග්‍රීසි, සෞන්දර්ය, ක්‍රීඩා සහ ප්‍රාථමික අධ්‍යාපනය යන එක් එක් විෂය සඳහා සිටිය යුතු ගුරුවරුන් සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

(iii) විදුහල්පති තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

(iv) වැඩබලන විදුහල්පතිවරුන් ලෙස සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව අධ්‍යාපන කලාපය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වැඩිම ගුරු හිඟය හා අතිරික්තය පවතින සහ වැඩිම විදුහල්පති හිඟය හා අතිරික්තය පවතින අධ්‍යාපන කොට්ඨාස විස්සේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3713/2023

ගරු එම්. ඒ. සුමන්දිරන් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2020 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා මඩකලපුවේ මහාධිකරණ නඩු කටයුතුවලට පත්කරන ලද සහ මාරුවීම් ලබාදෙන ලද විනිශ්චයකාරවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත මාරුවීම්, විනිශ්චයකාරවරුන්ට මාරුවීම් ලබාදෙන සාමාන්‍ය ක්‍රමය අනුව සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, ඉහත මාරුවීම්වලට හේතු කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

3718/2023

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එකතු කළ අගය මත බදු (VAT) ප්‍රතිශතය ඉහළ දමන ලද දිනයේ සිට මේ දක්වා අයකරගෙන ඇති මුළු VAT බදු ආදායම කොපමණද;

(ii) පෙර වර්ෂයේ එම කාලසීමාවට සාපේක්ෂව එම වැඩිවීමේ ප්‍රමාණය කොපමණද;

(iii) එම වැඩිවීම තුළ උද්ධමනය හේතුවෙන් වැඩි වී ඇති ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව ආදායම් බදු අනුපාත බලාත්මක කිරීමෙන් පසු අලුතින් විවෘත කර ඇති බදු ලිපිගොනු සංඛ්‍යාව සහ වැසී ගොස් ඇති බදු ලිපිගොනු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බදු ලිපිගොනු විවෘත කර තිබූ පුද්ගලයන් අතරින් 2023 වර්ෂයේදී විදේශ රටවලට සංක්‍රමණය වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) උපයන විට ගෙවීමේ බදු තුළින් මේ වනවිට රජයට ලැබෙන මාසික ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3754/2023

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංස්කෘතික මධ්‍යස්ථානය දීර්ඝ කාලයක සිට අබලන්ව ඇති බවත්;

(ii) එය අලුත්වැඩියා කිරීමට මේ දක්වා පියවර ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සංස්කෘතික මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම අලුත්වැඩියා කටයුතු ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3774/2023

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළමනාකරණ සේවා නිලධාරි සේවය සඳහා පෙර පැවති සුවිශේෂී කාර්ය සාධනය හෙවත් උසස්වීමේ විභාග ක්‍රමය නැවත ඇති කිරීම සඳහා අංක 22/0086/315/003 හා 2021.01.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමතිය ලබා දී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ අනුව උසස්වීමේ විභාග ක්‍රමය නැවත බලාත්මක කරනු ලබන දිනය කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පවතින වැටුප් විෂමතාවය ඉවත් කර, එම සේවයේ නිලධාරින්ට MN 3 වැටුප් තලය ලබා දීම සම්බන්ධයෙන් මේ වනවිට ප්‍රගතිය කවරේද;

(v) ඉහත සේවයේ මේ වනවිට සේවය කරනු ලබන උපාධිධාරි නිලධාරින් සඳහා ලබා දෙන විසඳුම කවරේද

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් නිලධාරින්ට ගෙවනු ලබන මූලික වැටුපෙන් 40%ක දීමනාව, ශ්‍රී ලංකා පොලිසියට අනුයුක්තව සේවය කරනු ලබන සිවිල් කාර්ය මණ්ඩලය සඳහාද ගෙවීමට පොලිස්පතිවරයා විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3822/2023

ගරු ජේ.සී. අලවතුවල මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් පදිංචිය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවට බෙදා දී ඇති එක් එක් ඉඩමේ නම, ඉඩමේ ප්‍රමාණය, ඉඩමට අයත් කට්ටි ප්‍රමාණය, ඉඩම් කට්ටි බෙදා දුන් දිනය, පිහිටා ඇති ගමේ නම, ග්‍රාම නිලධාරි වසමේ නම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත සඳහන් ඉඩම් කට්ටි සඳහා ඔප්පු ලබා දීමට පියවර ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, එම ඉඩම් සඳහා ඔප්පු ලබා දීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ඉඩම් කට්ටි බෙදා දීමේදී මුදල් අය කරන්නේද;

(ii) එසේ නම්, එසේ මුදල් අය කරනු ලබන පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 ජනවාරි 24 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

426/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තය නගා සිටුවීම සඳහා ස්ථාපිත කර ඇති රාජ්‍ය ආයතනවල නම් කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් නිෂ්පාදනයෙන් ගෘහස්ථ පරිභෝජනය, පොල් තෙල් නිෂ්පාදනය හා අපනයනය ආශ්‍රිත කර්මාන්ත යන එක් එක් අංශය සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2001 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවේ පොල් ඵලදාව එක් එක් වර්ෂයට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොල් ඵලදාව ඉහළ නැංවීම සඳහා ඉහත කාලය තුළදී සිදු කරන ලද වැඩසටහන් කවරේද;

(v) එම වැඩසටහන් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

436/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කිලෝග්‍රෑම් 1ක් බරැති සම්පූර්ණ යොදය සහිත හා යොදය රහිත කිරිපිටි පැකට්ටුවක් සහ ග්‍රෑම් 400ක් බරැති සම්පූර්ණ යොදය සහිත හා යොදය රහිත කිරිපිටි පැකට්ටුවක්—

(i) අලෙවි කරනු ලබන මිල;

(ii) භාවිතා කර සකස් කළ හැකි කිරි ලීටර් ප්‍රමාණය;

(iii) සෑදීමට භාවිතා කරනු ලබන දියර කිරි ලීටර් ප්‍රමාණය;

එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ අලෙවි කරනු ලබන දියර කිරි පැකට්වල පරිමාව සහ එම පරිමාව අනුව එක් එක් දියර කිරි පැකැට්ටුවක මිල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

694/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව, මඩ/පට්/කුරුක්කල්මඩම් කලෛයිවාණි මහා විද්‍යාලය මේ වනවිට මහ වීදියේ ස්ථාපිතකර ඇති අතර එම විද්‍යාලය පෙර තිබූ ස්ථානයේ පැවති ක්‍රීඩාපිටියෙන් කොටසක් මේ වනවිට ශ්‍රී ලංකා යුද හමුදාව භාරයේ පවතින බවත්;

(ii) ඒ හේතුවෙන් ක්‍රීඩා කිරීම සඳහා එම ක්‍රීඩාපිටිය භාවිතා කිරීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ක්‍රීඩාපිටිය ශ්‍රී ලංකා යුද හමුදාවෙන් නිදහස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නැගෙනහිර පළාතේ තවත් ක්‍රීඩාපිටි යුද හමුදාව භාරයේ පවතින්නේද;

(ii) එසේ නම්, එම ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) එම ක්‍රීඩාපිටිද ශ්‍රී ලංකා යුද හමුදාවෙන් නිදහස් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

826/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්ෂයකට නිෂ්පාදනය කරනු ලබන එළවළු ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) වාර්ෂිකව පරිභෝජනය කරනු ලබන එළවළු ප්‍රමාණය කොපමණද;

(iii) එළවළු නිෂ්පාදනයේ අතිරික්තයක් හෝ ඌනතාවයක් තිබේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදයේදී සහ වර්ෂ 2019 සිට 2021 දක්වා වූ කාල පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද එළවළු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

839/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප අතරින් ගුරු අතිරික්තයක් හා ගුරු හිඟයක් පවතින අධ්‍යාපන කලාප කවරේද;

(ii) එම අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව සහ හිඟ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

853/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා වෙත පොලිස් බලතල පැවරිය යුතු බවට වර්තමාන රජයේ ප්‍රධානීන් ප්‍රකාශ කර ඇති බව දන්නේද;

(ii) මේ වනවිට මධ්‍යම ආණ්ඩුව සතුව පවතින පොලිස් බලතල, පළාත් සභා වෙත පැවරීම සඳහා සැලැසුම් කර තිබේද;

(iii) ඒ හේතුවෙන් මේ වනවිට ශ්‍රී ලංකා පොලීසිය සහ ඊට අදාළ අනෙකුත් ආයතන සඳහා වැය කරනු ලබන වියදම් සංශෝධනය වන්නේද;

(iv) එසේ නම්, එම සංශෝධනය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභා වෙත පොලිස් බලතල ලබා දීමෙන් මේ වනවිට පවතින ශ්‍රී ලංකා පොලිසියේ බඳවාගැනීමේ පටිපාටියේ සිදු වන වෙනස්කම් කවරේද;

(ii) පළාත් සභා වෙත පොලිස් බලතල ලබා දීමෙන් අවි ආයුධ මිලදී ගැනීමේ බලතල සෘජුවම පළාත් පොලිසි වෙත හිමිවේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2023

ගරු රෝහණ බංඩාර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1718/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මෙරටට ලැබුණු විදේශ ප්‍රේෂණවල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වටිනාකම, සමස්ථ විදේශ විනිමය ඉපයීම්වල ප්‍රතිශතයක් ලෙස ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීත්‍යානුකූල ක්‍රමවේද ඔස්සේ ශ්‍රී ලංකාවට විදේශ මුදල් ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2020/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ මහපොළ අභ්‍යාස ආයතනය (මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය) ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ආයතනය විසින් මේ වනවිට පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් පාඨමාලාව කවරේද;

(iv) එම ආයතනය ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනයට යොදා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3799/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කඩුගන්නාව සිට ගම්පොල දක්වා විදුලි දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එම දුම්රිය මාර්ගය ඉදිකිරීමේදී ගම්පොල, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කහටපිටිය සහ බෝතලපිටිය යන ගම්මානවල පදිංචිකරුවන් විසින් භාවිතා කරනු ලබන දේවරාජ මාර්ගය ඇතුළු අනෙකුත් ප්‍රවේශ මාර්ග අහිමිවීමේ අවදානමක් පවතින බව දන්නේද;

(iii) එම පදිංචිකරුවන්ගේ නිවාස, මහවැලි ගඟ ආශ්‍රිතව පර්චස් 4,6 වැනි කුඩා ඉඩම් කොටස්වල ඉදිකර ඇති බැවින් ඔවුන්ගේ නිවාස/දේපලවලට සහ ප්‍රවේශ මාර්ගවලට හානි නොවන අයුරින් ඉහත මාර්ගය ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන විකල්ප යෝජනා සලකා බලන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජනවාරි 26 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1317/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කාති උසාවි සංඛ්‍යාව කොපමණද;

(ii) කාති උසාවි මඟින් ලබා දෙන ලද තීන්දු අනුව වර්ෂ 2015 සිට මේ දක්වා සිදු වී ඇති දික්කසාද සංඛ්‍යාව කොපමණද;

(iii) කාති උසාවිවල සේවය කරන වයස අවුරුදු 60 ඉක්මවූ කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) උපාධි සුදුසුකම් සහිත කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) කාතිවරුන් තෝරාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1467/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයේ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් අතරින් මධ්‍යම රජයට හා පළාත් සභාවලට අයත් ආයුර්වේද රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිරියේදී ඉදිකිරීමට සැලසුම් කර ඇති ඇති නව ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1515/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට චිත්‍රපටි ප්‍රදර්ශනය කරනු ලබන සිනමා ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා ජාතික චිත්‍රපටි සංස්ථාව විසින් ප්‍රදර්ශනය කර ඇති චිත්‍රපටි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2019 සිට මේ දක්වා චිත්‍රපටි නිෂ්පාදනය කිරීම සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1554/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව ඖෂධ පැළෑටි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, එම ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(iv) ඒවා අපනයනය කිරීමෙන් වාර්ෂිකව උපයනු ලබන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1585/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන බහුලව සිදු කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) කුරුඳු වගාව සඳහා පැළ සහ පොහොර ලබා දෙන පදනම කවරේද;

(iv) 2019 වර්ෂයෙන් පසු කුරුඳු වගා කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1626/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990 ඔක්තෝබර් 15 දින ශ්‍රී ලංකා රජය එළැඹි රැම්සා සම්මුතියට අනුව මුතුරාජවෙල තෙත්බිම් කලාපය ආරක්ෂා කරගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) මධ්‍යම පරිසර අධිකාරිය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුතුරාජවෙල තෙත්බිම් කලාපයේ ශාක හා සත්ත්ව ප්‍රජාව සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් නඩත්තු කර තිබේද;

(iii) මුතුරාජවෙල තෙත්බිම් කලාපයට අයත් ඉඩම්, අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි පිළිබඳව ගෙන ඇති විධිමත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1648/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා මේ වනවිට භාවිතා කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් පෞද්ගලික අංශයට බදු පදනම මත ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්/ආයතන කවරේද;

(v) ඉඩම් බදු දීම මඟින් අධිකාරිය උපයන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2402/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මූල්‍යමය ආධාරයක් ලබා දෙන්නේද;

(ii) එම මූල්‍යමය ආධාරය කොපමණද;

(iii) එම ආධාරය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iv) ඒ සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මූල්‍යමය ආධාරය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මේ වනවිට එම අධාරය ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සුදුසුකම් සපුරා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට එම ආධාරය ලබා දෙන්නේද;

(iii) එසේ නම් එම දිනය කවරේද;

(iv) එයින් නිවසක් නොමැති වකුගඩු රෝගීන් සිටින පවුල් සඳහා නිවසක් ඉදිකර දීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2697/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් සංඛ්‍යාව විද්‍යා, ගණිත, වාණිජ සහ කලා විෂය ධාරාව අනුව ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ සිසුන්ගෙන් බහුතරයක් අ.පො.ස. (උ. පෙ.) විද්‍යා හෝ ගණිත විෂය ධාරාව වෙත යොමු කරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ අතුරු අයවැයෙන් පශු සම්පත් සංවර්ධනය සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(ii) එයින් භාවිතා කරන ලද සහ භාවිතා නොකරන ලද ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ කුකුළු මස් නිෂ්පාදනය සහ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2024 ජනවාරි 26 සිකුරාදා)**

3741/2023

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛනයට අනුව අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල ලේකම්වරුන්ට සහ අමාත්‍යාංශයක ස්ථිර ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුන්ට විශ්‍රාම වැටුප් හිමි බව දන්නේද;

(ii) මේ වනවිට එම විශ්‍රාම වැටුප් ලබාගන්නා සහ ඒ සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් ලේකම්වරුන්ට වැන්දඹු/අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම සහ විශ්‍රාම පාරිතෝෂික හිමිකම ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාර්ගගත ක්‍රමයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අදාළ ලේඛන යොමු කිරීම සම්බන්ධයෙන් රජයේ ආයතනවල විෂය ලිපිකරුවන්ට පුහුණුවක් ලබා දෙන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ සෘජු දුරකථන අංකයක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අමාත්‍ය පෞද්ගලික කාර්ය මණ්ඩලයක ලේකම්වරයෙකු සහ වැවිලි රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු ලෙස කටයුතු කළ චමල් එස්. පියසුන්දර මහතාගේ විශ්‍රාම වැටුප මේ දක්වා ගෙවා නොමැති බව දන්නේද;

(ii) එයට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 82/2024

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,—ශ්‍රී ලංකාවේ නීති අධ්‍යාපනය පිළිබඳව සමාලෝචනය කර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—ශ්‍රී ලංකා නීති විද්‍යාලය 1900 තරම් ඈත අතීතයේ පනවන ලද 1900 අංක 2 දරන නීති අධ්‍යාපන සභා ආඥාපනතේ ප්‍රතිපාදන යටතේ ස්ථාපිත කරන ලද අතර නීති අධ්‍යාපන සභාව නිල බලයෙන්ම පත් වන සාමාජිකයින් තිදෙනකු හා අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් සිව්දෙනකු ඇතුළුව සාමාජිකයන් 7 දෙනකුගෙන් සමන්විත වන හෙයින්ද;

අග්‍රවිනිශ්චයකාරවරයා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ නීතිපතිවරයා එකී නිල බලයෙන්ම පත් වන සාමාජිකයින් තිදෙනා වන අතර අග්‍රවිනිශ්චයකාරවරයා නිල බලයෙන්ම පත් වන සභාපතිවරයා ලෙස කටයුතු කරන හෙයින් සහ නීති විද්‍යාලයේ විදුහල්පතිවරයා කලින් කලට කොන්ත්‍රාත් පදනම මත පත් කරනු ලබන හෙයින්ද;

පසුගිය දශක දෙක-තුනක කාලය තුළ ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති නමුදු අධ්‍යාපනයේ විෂය පථය පුළුල් වීම හෝ අවශ්‍ය පහසුකම් සැපයීම සිදු වී නොමැති අතරම ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට

(අ) තරඟ විභාගවලට පෙනී සිටීම මඟින් සෘජුව ඇතුළත් වීම

(ආ) (i) කොළඹ විශ්වවිද්‍යාලය

(ii) පේරාදෙණිය විශ්වවිද්‍යාලය

(iii) යාපනය විශ්වවිද්‍යාලය

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

(v) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

වෙතින් පිරිනමනු ලබන දේශීය එල්.එල්.බී. හෙවත් නීතිවේදී උපාධිය සම්පූර්ණ කිරීම

(ඇ) නීති අධ්‍යාපන සභාව විසින් පිළිගනු ලැබූ විදේශීය විශ්වවිද්‍යාලයකදී එල්.එල්.බී. හෙවත් නීතිවේදී උපාධිය සම්පූර්ණ කිරීම යන මාර්ග කිහිපයක්ම තිබෙන හෙයින්ද;

වර්තමානයේ ශ්‍රී ලංකා නීති විද්‍යාලය තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 7,500 ක් සිටියදී පවා එහි එක් ස්ථිර ගුරුභවතකු පමණක් සිටින අතර පවතින යටිතල පහසුකම් දශක කිහිපයකට පෙර පැවති ඒවාට සීමා වන හෙයින්ද;

නීති අධ්‍යාපන කටයුතු හා ශ්‍රී ලංකා නීති විද්‍යාලය පිළිබඳව යළි සමාලෝචනය කොට ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම බොහෝ කලක සිට සිදු විය යුතුව තිබූ හෙයින්ද;

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වෘත්තීයවේදී සුදුසුකම් සහිතව නීති වෘත්තියට පිවිසෙන වෘත්තීයවේදීන් කාණ්ඩ දෙකක්, එනම්

(අ) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පරීක්ෂණ තුනම සමත් නීතිඥවරුන්

(ආ) දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් එල්.එල්.බී. හෙවත් නීතිවේදී උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන පරීක්ෂණය සමත්ව ශාස්ත්‍රීයමය හා වෘත්තීයවේදීමය යන දෙආකාරයෙන්ම සුදුසුකම් සහිත නීතිඥවරුන්

සිටින හෙයින්ද;

බොහෝ රටවල පසුගිය දශක කිහිපය මුළුල්ලේ නීති අධ්‍යාපනයේ විෂය සීමාව පුළුල්ව ඇතිවා මෙන්ම බොහෝ නව විෂයයන් හා විෂය ක්ෂේත්‍රයන් නීති අධ්‍යාපනයට එක්ව තිබෙන හෙයින්ද;

(අ) නීති වෘත්තියේ අවශ්‍ය ප්‍රමිතිය සහ නීති වෘත්තීයවේදීන් සඳහා වූ නීති අධ්‍යයනය ආශ්‍රිත රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට;

(ආ) නීති වෘත්තීයවේදීන් සඳහා වූ නීති අධ්‍යාපනය නියාමනය කරනු පිණිස වූ පාලක මණ්ඩලය ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රතිපත්ති හා නෛතික රාමුවක් හඳුන්වා දීමට;

(ඇ) නීති අධ්‍යාපනය පිළිබඳ පාලක මණ්ඩලයට පත් කරනු ලබන සාමාජිකයින් සම්බන්ධයෙන් නිර්ණායකයක් හඳුන්වා දීමට;

(ඈ) (i) නීති විද්‍යාලයට ඇතුළත් කර ගන්නා ආකාරය හා ඒ සඳහා තිබිය යුතු මූලික අවශ්‍යතා; හා

(ii) නීති විද්‍යාලයට ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීමේ කාර්යය සඳහා නීති උපාධි පිළිගැනීම ආශ්‍රිතව යොදා ගත යුතු නිර්ණායක සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය හඳුන්වා දීමට

(ඉ) නූතන ලෝකය තුළ විවිධාකාරී වූ වෘත්තීයවේදී අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන මොඩියුල සඳහා වූ නිර්ණායක හඳුන්වා දීමට;

(ඊ) එය ස්වාධීනව හා ස්වයංතෘප්තව ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආකෘතියක් හඳුන්වා දීමට; සහ

(උ) වෘත්තීයවේදී නීති අධ්‍යයනය හා පරිචය පිළිබඳ ප්‍රමිතිය හා ප්‍රගමණය සඳහා ආනුෂංගික වෙනත් කවර හෝ කාරණයක් සඳහා ඇති වත්මන් අවශ්‍යතාවය සපුරාලීමට

නීති අධ්‍යාපනය පුළුල් කිරීමේ හා නව නෛතික රාමුවක් ඇති කර ගැනීමේ කාලීන අවශ්‍යතාවක් ඇති බැවින් ශ්‍රී ලංකාවේ නීති අධ්‍යාපනය පිළිබඳව සමාලෝචනය කර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත්කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන එවැනි අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.